## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ 2022.05.19 වන දින පැවති මාසික මහ සභා රැස්වීම් වාර්තාව.

පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ මාසික මහා සභා රැස්වීම 2022 මැයි මස 19 වන දින පෙ.ව.10.00 ට ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

ඒ සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් සහභාගී විය.

| | | | |
|---|---|---|---|
| 02. | උප සභාපති | - | ඩී.වී.උපාලි මැතිතුමා. |
| 03. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා. |
| 04. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමා. |
| 05. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා. |
| 06. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.ඩික්ෂන් හේමචන්ද්‍ර මැතිතුමා. |
| 07. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.වී.ආරියරත්න මැතිතුමා. |
| 08. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | කේ.ඒ.ලක්මිණී දසනායක මැතිතුමිය. |
| 09. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.එම්.එස්.දීප්ති ධර්ම ශ්‍රී මැතිතුමා. |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.එම්.උපාලි ජයරත්න මැතිතුමා. |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.වී.අජිත් නිශාන්ත මැතිතුමා. |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.එම්.හේමන්ත පෙරේරා මැතිතුමා. |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.ඉන්දික මැතිතුමා. |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය. |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජේ.ආර්.ශ්‍රියාලතා මැතිතුමිය. |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී.ඒ.නිශාන්ත බුද්ධාරච්චි මැතිතුමා. |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.එල්.සුමිත් කුමාර මැතිතුමා. |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එන්.වී.සමන් පුෂ්ප කුමාර මැතිතුමා. |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඊ.චන්දිම ධර්මප්‍රිය ඇලපාත මැතිතුමා. |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා. |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා. |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා. |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ.පියසේන මැතිතුමා. |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.චමින්ද ගුණරත්න මැතිතුමා. |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා. |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා. |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සෙල්වනායගම් රගවන් මැතිතුමා. |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය. |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | ඩී.පුෂ්පලතා වැලිකල මැතිතුමිය. |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ.සුගත් ශාන්ත අමරසේකර මැතිතුමා. |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී.එම්.ඉන්දික කුමාර දිසානායක මැතිතුමා. |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී.කේ.සුමේධ ලක්මාල් මැතිතුමා. |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා. |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | - | රාජරත්නම් පුවනේස්වරී මැතිතුමිය. |

පැමිණ සිටි සියලුදෙනාම ආගම සිහි කර, රණවිරුවන් සිහිකිරීමෙන් පසුව ගරු සභාපතිතුමන් විසින් අද දින මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපතිතුමා , ගරු විපක්ෂනායකතුමා ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා ද , ලේකම්තුමා හා නිලධාරීතුමිය ද පිළිගැනීමෙන් අනතුරුව සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සභාවේ කටයුතු ආරම්භ කරන ලදී.

**01. පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරීම. ( 2022.04.07 )**

2022.04.07 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා සංශෝධන ඇතොත් ඉදිරිපත් කිරීමටත් , සංශෝධන නොමැති නම් එම වාර්තාව සභා සම්මත කිරීමටත් ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදී.

ඒ අනුව 2022.04.07 දින පැවති මාසික මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කිරීමෙන් පසුව ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමාගේ විශේෂ නිවේදනය.**

2022.05.09 වන දින සිට රට තුළ පැවති ගැටුම්කාරී තත්වය මත ඇඳිරි නීතිය ක්‍රියාත්මක කිරීම නිසා 2022.05.12 වන දින පැවැත්වීමට තිබූ මහ සභාව 2022.05.19 වන අද දින පවත්වන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**03. සභාව අමතා එවන සංදේශ, මහජන පෙත්සම්/පැමිණිලි සභාව ඉදිරියේ තැබීම.**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**I. ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ යෝජනා.**

**01.** හිටපු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී චන්ද්‍රා ගන්කන්ද මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය පල කිරීම.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඩී.වී.උපාලි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ විශාල වැඩ කොටසක් පැල්මඩුල්ල බල ප්‍රදේශයට සිදු කළ ගරු චන්ද්‍රා ගන්කන්ද මැතිතුමා පැල්මඩුල්ල බල ප්‍රදේශයේ බිහි වූ කෘතහස්ත දේශපාලනඥයෙක් බව ය. දේශපාලන භේදයකින් තොරව සියලු දෙනා ම ගරු කළ එතුමා සෑම ගමකටම මෙන් ම ගෝණකුඹුර ප්‍රදේශයට ද ගමන් කිරීමට මාර්ගය කපා , විදුලිය ලබා දී ගම සංවර්ධනය කිරීමට මැදිහත් වූ බවත් , දේශපාලනඥයෙක් ලෙස පුද්ගලික පලි ගැනීම් කිසිවිටක නොතිබුන බවත් ය.තව දුරටත් ගරු සභාපතිතුමා පවසා සිටියේ එතුමා 88 හා 89 කාලයේ විශාල තරුණ පිරිසකගේ ජීවිත බේරා ගැනීමට කටයුතු කළ බවත් , පැල්මඩුල්ල ජනතාවට එතුමා කළ සේවාව කිසිදිනක අමතක කළ නොහැකි බවත් , එම වටිනා සේවාව නිසා දේශපාලන භේදයකින් තොරව සියලු දෙනාම එතුමාගේ අභාවය සම්බන්ධයෙන් කණගාටුවට පත් වූ බවත් ය.මානුෂීය හැඟීම් ඇති මිනිසුන්ගේ හදවත් වලට ඇහුන්කන් දෙන මිනිසුන්ගෙ කාරණා තේරුම් ගත් ගරු චන්ද්‍රා ගන්කන්ද මැතිතුමා හා ගරු ධර්මදාස වන්නිආරච්චි මැතිතුමා වැනි දේශපාලනඥයන් බිහි වීම වත්මන් අවධියෙහි විරල බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.විශේෂයෙන් ම එතුමාගේ පුත් ගරු දුනේෂ් ගන්කන්ද මැතිතුමා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය අමාත්‍යවරයෙක් ලෙස දීර්ඝ කාලයක් කටයුතු කරමින් පැල්මඩුල්ලට විශාල සේවාවක් කළ බවත් , සිය පවුල වෙත එතුමාගේ අභාවය සම්බන්ධයෙන් මුළු සභාවේ ම කණගාටුවත් ශෝකයත් පල කර යැවීම සුදුසු බවට ගරු සභාපතිතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු විපක්ෂනායකතුමා පවසා සිටියේ ගරු චන්ද්‍රා ගන්කන්ද මැතිතුමා නිහතමානී , අවංක , ඇහුන්කන් දෙන , ආදර්ශමත් දේශපාලන නායකයෙක් බවත් , එතුමාගේ පියාගේ කාලයේ සිට විශාල සේවාවක් රටට දැයට කළ පරම්පරාවක් බවත් ය.ර/ගන්කන්ද ජාතික පාසල , පහල බෝපිටිය විහාරස්ථානය එතුමන්ලාගේ මූලිකත්වයෙන් රටට දැයට දායද වූ ස්ථාන බවත් , රත්නපුර බෞද්ධ මන්දිරය තිබෙන බිම් කොටස ලබා ගැනීමේ දී ද එතුමාගේ පියා මුදල් ආධාර ලබා දී ඇති බවත් ය.එතුමා දේශපානයට පැමිණීම මේ ප්‍රදේශයේ ජනතාවගේ භාග්‍යයක් බවත් , එතුමා දේශපානයට පැමිණීමට පෙර සංවිධායකකම ලැබෙන විටත් ගම් වලට ගොස් මිනිස්සු හඳුනා ගෙන මිනිසුන්ගෙ සිත් සතන් අදහස් තේරුම් ගෙන මිනිස්සු සමඟ සමීපව කටයුතු කළ බවත් , යම් තනතුරක් ලබා ගැනීමට පෙර ඊට සුදුස්සෙක් වූ බවට එමඟින් සහතික වන බවත් ගරු විපක්ෂනායකතුමා පවසන ලදී.77 එක්සත් ජාතික පක්ෂ රජයෙන් එතුමා පැල්මඩුල්ල ආසනයේ මන්ත්‍රීවරයා වන විට රිල්හේනට පමණක් විදුලිය තිබූ බවත් , ඒ කාල වකවානුවේ දැවැන්ත සංවර්ධනයන් කරමින් පැල්මඩුල්ල ආසනයේ විශාල විදුලි ව්‍යාපෘති ක්‍රියාත්මක කර විදුලි බලය ලබා දීමට හා උදා ගම්මාන කිහිපයක් පැල්මඩුල්ල ආසනයට ලබා ගැනීමට එතුමාට හැකි වූ බවත් , එතුමා ළඟට පැමිණි හැම පුද්ගලයෙකුට ම දේශාපාලනයෙන් තොරව රැකියා විශාල ප්‍රමාණයක් ලබා දීමට හා රැකියා ලබා ගැනීමට අවශ්‍ය සහය ලබා දීමට සමත් වූ බවත් ගරු විපක්ෂනායකතුමා පවසන ලදී.එතුමා දිවන්ගත හිටපු ආණ්ඩුකාර ධර්මදාස වන්නිආරච්චි මැතිතුමා සමඟ ද සුහදව කටයුතු කළ බවත් , කිසිදිනක දේශපාලන විරසක එතුමන්ලාගේ පවුල් අතර සිදු නොවූ බවත් , එනිසා එදා හවුහරණක් රැකවරණයක් නැතිව නිදහසේ ඕනෑම ස්ථානයක ගමන් කිරීමට එතුමාට අවස්ථාව ලැබුනු බවත් , ගරු ධර්මදාස වන්නිආරච්චි මැතිතුමා තේ කර්මාන්තශාලා ගොඩනැගීමේ දී එමඟින් රැකියා අවස්ථා ජනතාවට උදා වීම හේතුවෙන් එවැනි දේ සඳහා ද මෙතුමා සහයෝගය ලබා දුන් බවත් ගරු විපක්ෂනායකතුමා පවසන ලදී.එතුමාගෙන් සිදු වුනු ඉතා විශිෂ්ට සේවාව හේතුවෙන් සභාවේ  ශෝකය , සංවේගය පවුලේ සියලු දෙනා වෙනුවෙන් ප්‍රකාශ කිරීම සුදුසු බවට ගරු විපක්ෂනායකතුමා පවසන ලදී.

ගරු උප සභාපති ඩී.වී.උපාලි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ වෙනත් දේශපාලන පක්ෂයක සිටීම හේතුවෙන් ගරු චන්ද්‍රා ගන්කන්ද මැතිතුමාට එක් ඡන්දයක්වත් ලබා දීමට නොහැකි වීම සම්බන්ධව තමන් කණගාටු වන බවත් , එනමුත් කිසිදිනක ලොකු විවේචනයක් ද එතුමා සම්බන්ධව නොතිබූ බවත් , එතුමා දේශපාලනයෙන් මිල මුදල් ලබා ගත් පුද්ගලයෙක් නොවන බවත් , ඉතා ම නිහතමානී , නිහඬ වටිනා චරිතයක් බවත් , එනිසා එතුමා ඡන්දය ඉල්ලූ සෑම අවස්ථාවකම ජයග්‍රහණය කළ බවත් , වත්මන් දේශපාලනඥයන්ට එතුමාගේ චරිතයෙන් ආදර්ශ බොහොමයක් ගත හැකි බවත් ය.තව ද එතුමන්ට නියෝජ්‍ය සෞඛ්‍ය ඇමති ධූරය ලැබුනු විට රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට රැකියා බොහොමයක් ලබා දුන් බවත් , භීෂණ කාලයේ දී ද කිසිවිටක ඒවාට සම්බන්ධ නොවූ පුද්ගලයෙක් බවත් , ජයග්‍රහණය කළ කිසිම අවස්ථාවක අනිත් පක්ෂ වල කිසිවෙකුට කිසිම හිරිහැරයක් නොකළ බවත් , පැල්මඩුල්ලට අති විශාල සේවාවක් කළ මෙවැනි චරිත අප අතරින් වෙන් වූ විට තව තවත් අගය දැනෙන බවත් , එතුමාගේ නිවස ගරු ඩී.එස්.සේනානායක මැතිතුමා හා ගරු ඩඩ්ලි සේනානායක මැතිතුමා වැනි ඉතා වටිනා චරිත පය ගහපු නිවසක් බවත් , ඉතාම නිහතමානීව ඒ වලව්වෙ සිටිමින් කටයුතු කළ බවත් , අවසානයේ එතුමා බලාපොරොත්තු වන අමාමහ නිවන් සුව ලැබේවා කියා ප්‍රාර්ථනා කරන බවත් , සභාවේ සියලු දෙනා වෙනුවෙන් ශෝකය පල කරන බවත් ගරු උපසභාපතිතුමා පවසන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ප්‍රේමදාස මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ යහපත් දේශපානයක යෙදුන ගරු චන්ද්‍රා ගන්කන්ද මැතිතුමා කළ යුතු දේ කුමක් ද යන්න තේරුම් ගෙන එය ඉටු කිරීමට උත්සාහ ගත් බව ය.එදා ගරු  අගමැති ආර්.ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ දී ගරු චන්ද්‍රා ගන්කන්ද මැතිතුමාගේ මූලිකත්වයෙන් හකමුව ගමට නිවාස 10ක් ලබා දුන් බවත් , වත්මන් අවධියේදී ද එම මිනිසුන් තුළ එම කෙළෙහෙගුණය ඇති බවත් , නිහතමානී දේශපාලනඥයෙක් මෙන් ම අනිත් දේශපාලනඥයින් සමඟ සහයෝගයෙන් කටයුතු කළ පුද්ගලයෙක් බවත් , එතුමා දේශපාලන කටයුතු වල දීර්ඝ කාලීනව රැඳී සිටියා නම් ගමට රටට විශාල සේවයක් ලබා ගැනීමට තිබූ බවත් , අභාවප්‍රාප්ත ගරු චන්ද්‍රා ගන්කන්ද මැතිතුමා පිළිබඳව අපගේ ශෝකය ප්‍රකාශ කරන බවත් එතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ ගරු චන්ද්‍රා ගන්කන්ද මැතිතුමා දේශපාලන ගුරුවරයෙක් ලෙස විශාල සේවයක් කළ චරිතයක් බවත් , බෝපැත්ත ගමේ නිර්මාණකරුවා ලෙස හැඳින්වීම නිවැරදි බවත් , මාර්ගය සාදා බස් යොදවා ගමට විදුලිය ලබා දී බොහෝ සේවාවන් කළ එතුමා නිහතමානී මෙන් ම ආදර්ශමත් චරිතයක් බවත් ය.එතුමා වෙනුවෙන් උපහාර උළෙලක් පවත්වන්නට කටයුතු සූදානම් කළ ද ඇති වූ විවිධ හේතූන් මත එය කිරීමට නොහැකි වීම සම්බන්ධව කණගාටු වන බවත් , සෑම විටම එතුමා දේශපාලන ඉතිහාසය කියා දෙමින් දේශපාලනය කරන ආකාරය පිළිබඳව උපදෙස් ලබා දුන් බවත් , මිනිස්සු සමඟ පුදුම සහසම්බන්ධයකින් කටයුතු කළ බවත් , පැල්මඩුල්ලෙ ව්‍යවසායකයන්ට උදව් කළ බවත් , එනිසා පැල්මඩුල්ල මේ ආකාරයට දියුණු වී කර්මාන්ත ශාලා විශාල ප්‍රමාණයක් තිබෙන බවත් , යටිතල පහසුකම් සාදා මාර්ග සාදා විදුලිය ලබා දුන් බවත් , එතුමාට ප්‍රාර්ථානා කරන බෝධියකින් අමාමහ නිවන් සැප ලැබේවා කියා ප්‍රාර්ථනා කරන බවත් , මෙම යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා ඇතුළු සභාවට ස්තූතිවන්ත වන බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසන ලදී.

**තීරණ අංක 01**

හිටපු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී චන්ද්‍රා ගන්කන්ද මැතිතුමාගේ අභාවය සම්බන්ධයෙන් එතුමන්ගේ භාර්යාව , දූ දරුවන් ඇතුළු ඥාති හිතමිත්‍රාදීන් වෙත පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ශෝකය පළ කර ලිපියක් යැවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**02.** 2023 වර්ෂයට අදාල වාර්ෂික අයවැය ලේඛනය සකස් කිරීමේ කාල සටහන අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඩී.වී.උපාලි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 02**</u>

2023 වර්ෂයට අදාල වාර්ෂික අයවැය ලේඛනය සකස් කිරීමේ කාල සටහන අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**03.** පැල්මඩුල්ල පොදු වෙළෙඳපොල අංක 14 දරණ මාළු කඩ කාමරය සඳහා 2022 පෙබරවාරි මාසයේ සිට මාසික කඩ කුලී ගෙවීම බඳුකරු වන එච්.ඩබ්.මහේෂ් වඩුගේ යන අය විසින් පැහැර හැර ඇති අතර හිඟ කඩ කුලී ගෙවන ලෙස ලිඛිතව දැනුම් දීම් කළ ද ගෙවීම් කර නොමැත.බදුකරුගෙන් අය විය යුතු හිඟ කඩ කුලී අයකර ගැනීමෙන් අනතුරුව බඳුකරු ටෙන්ඩරයෙන් ඉවත් කර දෙවනුවට වැඩිම ලංසුව ඉදිරිපත් කර ඇති පුද්ගලයාට ටෙන්ඩරය ලබා දිය යුතු බැවින් සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු සභාවට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඩී.වී.උපාලි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

<u>**තීරණ අංක 03**</u>

පැල්මඩුල්ල පොදු වෙළෙඳපොල අංක 14 දරණ මාළු කඩ කාමරය සඳහා 2022 පෙබරවාරි මාසයේ සිට මාසික කඩ කුලී ගෙවීම පැහැර හැර ඇති බඳුකරු වන එච්.ඩබ්.මහේෂ් වඩුගේ යන අයට 2022.05.31 දින දක්වා මාළු කඩ කාමරය පවත්වා ගෙන යාමට ඉඩ දී එදිනෙන් පසුව ඔහු විසින් ඇති කර ගෙන ඇති ගිවිසුම අවලංගු කර , 2022.05.31 දින දක්වා ඔහුගෙන් අය විය යුතු සියලු ම ආකාරයේ බදු හා ගාස්තු අය කර , බඳුකරු ටෙන්ඩරයෙන් ඉවත් කර 2022.06.01 වන දින සිට දෙවනුවට වැඩිම ලංසුව ඉදිරිපත් කර ඇති පාතකඩ පටබැඳිගේ ප්‍රියන්ත යන අයගෙන් කැමැත්ත විමසා ඔහුට හෝ ඔහු ඉදිරිපත් නොවන්නේ නම් පිළිවෙලින් ඊළඟට සිටින බඳුකරුට ටෙන්ඩරය ලබා දීම සුදුසු බවටත් ඒකමතිකව සහා සම්මත විය.

**04.** වත්මන් අවධියේ ඩීසල් මිල වැඩි වීමත් සමඟ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් කුලියට ලබා දෙන යන්ත්‍ර සඳහා පහත පරිදි ගාස්තු සංශෝධනය කිරීමට යෝජනා කරමි.

| යන්ත්‍රය | පැවති ගාස්තුව | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| ජේ.සී.බී.යන්ත්‍රය පැයක් සඳහා | රු.2,800.00 | රු.4,500.00 |
| ගලි බවුසරය කිලෝ මීටර් 01ක් සඳහා | රු. 100.00 | රු. 200.00 |

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උපසභාපති ඩී.වී.උපාලි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු විපක්ෂනායකතුමා පවසා සිටියේ තක්සේරු කර ගාස්තු සංශෝධනය කළා නම් ගැටළුවක් නොමැති බව ය.

ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ වර්තමානයේ පුද්ගලික අංශයේ පවතින රේට් එක සලකා බලා ඒ අනුව තක්සේරු කර ගාස්තු සංශෝධනය කළ බව ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ ගලි බවුසරයේ සේවාව බොහෝ දුරට පර්චස් 4 , 5 ඇති විශාල ඉඩම් නොමැති පුද්ගලයින් ලබා ගන්නා බවත් , මෙම මුදල ගෙවා ගැනීමට නොහැකිව ඔවුන් අසරණ තත්වයට පත් වන බවත් , ගලි බවුසරයේ සේවාව ලබා ගැනීමට නොහැකි වුවහොත් අසල් වාසීන්ට ද ජීවත් වීමට අපහසු වන බවත් , එහි දී අසල් වාසීන්ගේ චෝදනා හේතුවෙන් මෙම ජනයා තව දුරටත් අසරණ තත්වයට පත් වන බවත් , එනිසා කාරුණික අවධානය යොමු කර සභාවට පාඩුවක් වුවද පැවති මුදලටම ගලි බවුසරයේ සේවාව ලබා දීම සුදුසු බව ය.

ඊට අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ගලි බවුසරයේ සේවාව බොහෝ දුරට ව්‍යාපාරික ස්ථාන හා නාගරික ප්‍රදේශ වල ජනතාව ලබා ගන්නා බවත් , ග්‍රාමීය ප්‍රදේශ වලින් ගලි බවුසරයේ සේවාව ලබා ගැනීම ඉතා ම අවම බවත් , අවශ්‍ය නම් ගලි බවුරයේ සේවාව ලබා ගත් පුද්ගලයින් සම්බන්ධව ලිපි ගොනු පරීක්ෂා කර තොරතුරු ලබා ගත හැකි බවත් , සානුකම්පිත හේතුවක් මත යම් පුද්ගලයෙකුට සේවාව ලබා දීමට සිදුවුවහොත් සභාව විසින් තීරණය කර අවශ්‍යතාවය ලබා දීම සුදුසු බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

ඒ සම්බන්ධව අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ එසේ නම් යෝජනාව සංශෝධනය කර හෝ තීරණයක් ලබා ගැනීම සුදුසු බව ය.

ඒ අනුව අඩු ආදායම්ලාභී පුද්ගලයෙක් විශේෂ ඉල්ලීමක් කළහොත් සභාවේ අභිමතය පරිදි පෙර පවතින මුදලට ගලි බවුසරයේ සේවාව ලබා දීමටත් , සේවාව නිතර ලබා ගන්නා ව්‍යාපරික ස්ථාන හා නාගරික ප්‍රදේශවාසීන්ට සංශෝධිත මුදලට සේවාව ලබා දීම සුදුසු බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

<u>**තීරණ අංක 04**</u>

වත්මන් අවධියේ ඩීසල් මිල වැඩි වීමත් සමඟ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව විසින් කුලියට ලබා දෙන ජේ.සී.බී.යන්ත්‍රය හා ගලි බවුසරය සඳහා ඉහත පරිදි ගාස්තු සංශෝධනය කිරීම සුදුසු බවටත් , ගලි බවුසරයේ සේවය ලබා දීමේ දී අඩු ආදායම්ලාභී පුද්ගලයෙක් විසින් විශේෂ ඉල්ලීමක් කළහොත් අඩු ආදායම්ලාභී බවට ග්‍රාම නිලධාරී විසින් ලබා දෙන වාර්තාව සමඟ සභාවට යොමු කර මහා සභාවේ අභිමතය පරිදි පෙර පැවති ගාස්තුවට ම සේවය ලබා දීම සුදුසු බවටත් ඒකමතිකව සහා සම්මත විය.

**හදිසි යෝජනා**

**ගරු සභාපති එච්.ඒ.ලක්ෂ්මන් ප්‍රේමරත්න මැතිතුමාගේ හදිසි යෝජනා.**

01. 2022.02.10 දින සභාවේ තීරණ අංක 11 යටතේ නාරංගොඩ ජනපදයේ දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීමට ඉදිරිපත් වූ තීරණය පරිදි මේ දින වල පවතින වර්ෂාව හේතුවෙන් ජනයාට පවතින අපහසුතාවයන් කඩිනමින් වැළැක්වීමටත් , දිනෙන් දින ද්‍රව්‍ය වල මිල ගණන් ඉහළ යාම නිසා අදාල ඇස්තමේන්තුව අනුව කඩිනමින් වැඩ ආරම්භ කළ යුතු නිසාත් ඊට අදාලව සකස් කළ ඇස්තමේන්තුව හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**තීරණ අංක 05**

2022.02.10 දින සභාවේ තීරණ අංක 11 යටතේ නාරංගොඩ ජනපදයේ දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීමට ඉදිරිපත් වූ තීරණය පරිදි මේ දින වල පවතින වර්ෂාව හේතුවෙන් ජනයාට පවතින අපහසුතාවයන් කඩිනමින් වැළැක්වීමට හා දිනෙන් දින ද්‍රව්‍ය වල මිල ගණන් ඉහළ යාම නිසා අදාල ඇස්තමේන්තුවට අනුව කඩිනමින් වැඩ ආරම්භ කළ යුතු නිසා ඊට අදාලව සකස් කළ ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමාගේ හදිසි යෝජනා.**

01. පැල්මඩුල්ල බල ප්‍රදේශයේ වැලිමළුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ එස්.කේ.ලාල් කුමාර යන අයගේ ඉඩමෙහි ඇති අඩි 30-50 ප්‍රමාණයේ පොල් ගස් හතර යූ.එම්.එන්.ජේ.උඩගෙදර යන අයගේ ජීවිත හා දේපල වලට හානි සිදු විය හැකි බව පවසමින් කපා හරින ලෙස කළ ඉල්ලීමට අනුව කාර්මික නිලධාරීතුමා විසින් සිදු කරන ලද පරීක්ෂාව අනුව එම ගස් හතරෙන් තුනක් කපා ඉවත් කිරීම හා එක් ගසක් පමණක් කම්බි දමා ඇද බැඳ තැබීම සුදුසු බවට වාර්තා කර ඇත.පළාත් සභාව විසින් ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 107 වගන්තිය ප්‍රකාරව ලැබී ඇති බලතල අනුව විධිමත්ව කටයුතු කර අනතුරුදායක තත්වය ඉවත් කරන ලෙස දන්වා ඇත.මෙම පෞරාණික පොල් ගස් ඵලදාවෙන් ඉතා ඉහළ නිසා ආරක්ෂා කර තබා ගැනිම සුදුසු නිසාත් , අතීතයේ සිට පැවති මෙම පොල් ගස් ආසන්නයේ නිවස සාදා පසුව එම ගස් අනතුරුදායක බවට පවසමින් ඉවත් කරන ලෙස ඉල්ලා සිටීම නිසා සිදු වන අසාධාරණය හේතුවෙන් කමිටුවක් පත් කර සාධාරණ පරීක්ෂණයක් පවත්වා සාධාරණ විසඳුමක් ලබා දීමට යෝජනා කරමි.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය මන්ත්‍රී කේ.ජේ.ශ්‍රීනාත් ඇන්තනී මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා පවසා සිටියේ මේ සම්බන්ධව කඩිනම් විසඳුමක් අවශ්‍ය වීම හේතුවෙන් හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරන බව ය.මෙහි දී ඉඩම් කොටස කට්ටි කර විකිණීමේ දී යූ.එම්.එන්.ජේ.උඩගෙදර යන පුද්ගලයා විසින් ද ඉඩම් කොටසක් අයිතිකරුගෙන් මිල දී ගෙන ඇති අතර දැනට ඉඩම මායිමේ නිවස ගොඩනගමින් පවතින බවත් , ගස් අයිතිකරු මෙන් ම අනතුරුදායක නිවෙස් හිමියා යන දෙදෙනාම තමාගේ හිතවතුන් බවත් , ප්‍රාදේශීය සභා පනතෙහි විධිවිධාන අනුව ජීවිත හා දේපල හානි වළක්වා ගැනීම ප්‍රධාන කාරණය නිසා සභාවේ නිලධාරීයා මේ සම්බන්ධව ඉදිරිපත් කර ඇති නිර්දේශය නිවැරදි වන නමුත් පෙර කාලයේ සිට පැවති පොල් ගස් මුල යූ.එම්.එන්.ජේ.උඩගෙදර යන පුද්ගලයා විසින් නිවස සාදන අතරතුර මෙම පොල් ගස් හතර අනතුරුදායක යැයි පැවසීම අසාධාරණ වන බවත් , මෙහි දී මධ්‍යම රජයට හෝ දැනුම් දී පනත වෙනස් කළ යුතු බවත් , නැතිනම් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව ලෙස මන්ත්‍රීවරුන්ගෙන් හා නිලධාරීන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මේ සඳහා පත් කර සාධාරණ පරීක්ෂණයක් සිදු කර කමිටුව හරහා නිරදේශයක් ලබා ගැනීම සුදුසු බවත් , මෙම කාරණයේ දී කොමසාරිස්තුමා පනත අනුව ගස කැපීමට අනුමැතිය ලබා දී ඇති මුත් ඵලදාවෙන් ඉතා ඉහළ අතීතයේ සිට පවතින මෙම පොල් ගස් කැපීම අසාධාරණ බවත් ගරු මන්ත්‍රීතුමා පෙන්වා දෙන ලදී.මීට පෙර පාතකඩ මී ගහක් සම්බන්ධව තමන් අදහස් ඉදිරිපත් කළ බවත් , මී ගහක් ඔක්සිජන් ගබඩාවක් නිසා විනාශ කිරීම ජාතික අපරාධයක් බවත් , අසල්වාසීන් අතර විරසක ඇති වී පරම්පරා ගණනක් පැවති කොස් ගහ කැපීම සම්බන්ධවත් මෙවැනි ගැටළු මතු වූ බවත් , එනිසා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව ලෙස රටට කරන සේවයක් , ආදර්ශයක් ලෙස සලකා මෙවැනි ගැටළු සාධාරණව විසඳා ගැනීමට නිසි වැඩ පිළිවෙලක් සකස් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා අදහස් දක්වන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටියේ මෙම පොල් ගස් කපන්නෙ නැතිව ආරක්ෂා කර ගැනීමට පොදු වැඩ පිළිවෙලක් සකස් කළ යුතු බව ය.පොල් ගස් ඇද බැඳිය හැකි බවත් , එසේ කිරීමට මුදල් නොමැති පුද්ගලයින් සඳහා මහජනතාවට සේවය සපයන ආයතනයක් ලෙස සභාවේ යෝජනාවක් දමා සභාවේ වියදමෙන් හෝ අවශ්‍යතාවය ඉටු කර දීම සුදුසු බවටත් , පරිසර ප්‍රශ්න වැඩි බවත් , මේ සඳහා ග්‍රාම නිලධාරී සම්බන්ධ කර ගෙන පොදු වැඩ පිළිවෙලක් සකස් කළ යුතු බවත් , රිල්හේනෙ අතු කපා ආරක්ෂා කර ගැනීමට තිබූ ගහක් කපා ඉවත් කළ බවත් , ඒ සම්බන්ධව ග්‍රාම සේවකගෙන් විමසූ විට නිවැරදිව රාජකාරී කටයුතු කළ බව පැවසූ බවත් , ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් විමසූ විට ඒ සඳහා බලපත්‍රයක් දී නොමැති බව පැවසූ බවත් , ඉදිරියට මෙවැනි ගැටළු සඳහා අදාල නිලධාරීන් සම්බන්ධ කර ගෙන කොට්ඨාස මට්ටමින් විසඳීම සුදුසු බවත් වැඩිදුරටත් එතුමා පවසා සිටින ලදී.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ කාර්මික නිලධාරීතුමා වාර්තා කළ පසු ගස් කැපීමට තමන් විසින් අත්සන් කර නියෝග යවන බවත් , එහි දී දෙපාර්ශවයම කැමැත්තෙන් අනතුරුදායක ගස් ඉවත් කරන අවස්ථා ඇති මුත් සමහර අවස්ථා වල දී දෙපාර්ශවය තුළ ගැටළු ඇති වන අවස්ථා ද ඇති බව ය.මෙම යෝජනාව ද එසේ දීර්ඝ කාලීනව පවතින බරපතල ගැටළුවක් බවත් , තමන්ගේ ගමෙහි සිදුවීමක් බවත් , මෙම ඉඩම සභාවේ අවසරයක් නොමැතිව කට්ටි කර විකුණා ඇති බවත් , ඉතා පැරණි පොල් ගස් යට නිවස ගොඩනගන අතරතුර පොල් ගස් වලින් අනතුරු බවත් පොල් ගස් කපා අනතුර වළක්වා දෙන ලෙසත් යූ.එම්.එන්.ජේ.උඩගෙදර යන අය ඉල්ලා සිටින බවත් පැවසූ ගරු සභාපතිතුමා නිවැසියන් දැනට නිවසෙහි පදිංචි වී නොමැති නිසා එම පොල්ගස් වලින් ජීවිත හානියක් සිදු වීම අඩු බවත් , දෙපාර්ශවයම දන්නා හඳුනන අය බවත් , ලේකම්තුමා ඇතුළුව කොට්ඨාසයේ මන්ත්‍රීතුමත් සම්බන්ධ කර ගෙන මේ සම්බන්ධව වැඩි දුර විමර්ශනයක් කිරීම සුදුසු බවත් , ලබා දෙන තීරණය අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බවත් , පනත අනුව ගස කපා අනතුරු ඉවත් කිරීමට සිදු වන නමුත් මෙය ප්‍රායෝගිකව ගැටළුවක් වී ඇති බවත් පවසන ලදී.

අදහස් දක්වමින් ගරු විපක්ෂනායකතුමා පවසා සිටියේ මෙම පොල් ගස් කැපීමට තමන් ද විරුද්ධ වන නමුත් ගස් වලින් අනතුරක් සිදු වුවහොත් අනවසර ඉදිකිරීමට වඩා අනතුරක් සිදු වී ඇති නිසා පනත අනුව ක්‍රියාත්මක වී නොමැති බවට සභාවට ගැටළු , චෝදනා එල්ල විය හැකි බවත් , එනිසා සභාවෙන් නියෝග ලබා දෙන විට පනත සලකා බැලිය යුතු බවත් , පනත වෙනස් කළ නොහැකි බවත් , කාර්මික නිලධාරීතුමා ගස බලා කැපීමට නිර්දේශ කළ විට එය නොකර සිටිය නොහැකි බවත් , විධිමත් වැඩපිළිවෙලකට යා යුතු බවත් , අහිංසක මිනිසුන්ට කඹයක් දමා අනතුරුදායක තත්වය වළක්වා ලීමට මුදල් නොමැති

අවස්ථා වලදී සභාව මැදිහත් වී කටයුතු කළ යුතු බවත් , එවිට ගස් ආරක්ෂා කර ගැනීමට හැකි වන බවත් ය.තව ද ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමිය විදුලි බල අමාත්‍යවරිය ලෙස කටයුතු කරන කාලයේ සම්බන්ධීකරණ කමිටුවේදීත් මෙම සභාවේදීත් බකට් ලොරියක් ගැනීම සුදුසු බවට තමන් යෝජනා කළ බවත් , එමගින් ගස් වල අතු කැපීමට පහසු බවත් , ගස් කපා ඉවත් නොකර අතු කපා අනතුර වලක්වා ගත හැකි බවත් එතුමා පවසන ලදී.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල ඩයස් වික්‍රමනායක මැතිතුමා පවසා සිටියේ ප්‍රාදේශීය සභා පනත පිළිබඳව සාමාන්‍ය ජනයා දැනුවත් නොමැති බවත් , එනිසා විවිධ මට්ටමින් එය දැනුවත් කිරීමට කටයුතු කිරීම සුදුසු බවත් ය.

අදහස් දක්වමින් ගරු උප සභාපතිතුමා පවසා සිටියේ කමිටුවක් පත් කර මේ සම්බන්ධව තීරණයක් ගැනීම සුදුසු බව ය.

අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය , ලේකම්තුමා , ග්‍රාම නිලධාරීතුමා , කාර්මික නිලධාරීතුමා හා ප්‍රදේශයේ ගරු මන්ත්‍රීතුමා සම්බන්ධ කර ගෙන විධිමත් පරීක්ෂණයක් සිදු කර ඊළඟ සභා වාරයකට ඉදිරිපත් කර තීරණයක් ගැනීම සුදුසු බව ය.

අදහස් දක්වමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.චින්තක දේශප්‍රිය සුරවීර මැතිතුමා පවසා සිටියේ ප්‍රේමකුමාර ගන්කන්ද මයාගේ නිවසෙහි මීට විසඳුමක් ලෙස කුඩයක් සවි කර ඇති බවත් , පොල් ගහ ආරක්ෂා වීම මෙන් ම පොල් කුඩයට පොල් වැටීම නිසා එමගින් සිදු වන අනතුර ද එමගින් අවම වන බවත් , එය සකස් කිරීමට මුදල් වැය වන බවත් ය.

<u>තීරණ අංක 06</u>

පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙනුවෙන් ප්‍රජා සංවර්ධන නිලධාරීතුමිය ඇතුළුව පහත කමිටුව විසින් සාධාරණ පරීක්ෂණයක් පවත්වා , ලබා දෙන වාර්තාව ඊළඟ මහා සභාවට ඉදිරිපත් කර , ඒ අනුව මෙම යෝජනාව සම්බන්ධව සුදුසු තීරණයක් ගැනීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

| | | |
|---|---|---|
| 1.ඩබ්.එන්.කේ.ශාන්ති මිය | - | ප්‍රජා සංවර්ධන නිලධාරී |
| 2.ආර්.කේ.කපිල ජගත් ගුණතිලක | - | ලේකම් |
| 3.ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී | | |
| 4.කාර්මික නිලධාරීතුමා | - | බී.එම්.එස්.ඉරෝෂන් මයා |
| 5.ප්‍රදේශයේ ගරු මන්ත්‍රීතුමා | - | එස්.කේ.අජිත් සිරිවර්ධන මැතිතුමා |

**06. කාරක සභා වාර්තා සලකා බැලීම - 2022-04-07 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම.**

2022-04-07 දින පැවති මුදල් කමිටු රැස්වීම් වාර්තාව අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා මැතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

**07. 2022-04-01 සිට 2022-04-30 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව අනුමත කිරීම හා ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගිති වාර්තාව සලකා බැලීම.**

2022-04-01 සිට 2022-04-30 දක්වා මාසයට අදාළ වූ සභාවේ ගෙවීම් වාර්තාව , ලැබීම් හාවියදම් පිළිබඳ මාසික ප්‍රකාශ , එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එල්.සුමිත් කුමාර මැතිතුමන් විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**08. වෙනත් කරුණු**

- **සභාව දැනුවත් කිරීමේ නිවේදන හා අදහස් දැක්වීම්**

පැල්මඩුල්ල විශාල ලෙස අපකීර්තියට පත් වූ අවස්ථාවක් ලෙස පසු ගිය අවධියේ පැල්මඩුල්ල විවිධ සේවා සමුපකාර සමිතියෙ සිදු වූ සීනි වංචාව හැඳින්විය හැකි බවත් , පසුගිය කොරෝනා කාලයේ ජනතාවට විශාල සේවයක් සමුපකාර මඟින් සිදු කළ ද මේ සිද්ධියත් සමඟ ජනතාවට නිවැරදිව සේවාව ලබා දුන්නා ද යන්න සැකයන් මතු වන බවත් , ජනතාවට සහන මිලට ලබා දීමට ගෙනා භාණ්ඩ අවුරුදු ගණනක සිට හොරෙන් වෙනත් අයගෙ ජාවාරම් බවට පත් වී ඇති බවට නිර්නාමිකව දැනුවත් කරන බවත් , මේ සම්බන්ධව කතා නොකර නිශ්ශබ්දව සිටින බවට පැල්මඩුල්ල ප්‍රදේශය පුරා ම ජනතාවගෙන් චෝදනාවක් පවතින බවත් , කොමසාරිස්තුමාව දැනුවත් කර මෙම අධ්‍යක්ෂ මණ්ඩලය අත්හිටුවා කොමසාරිස්ගෙ පාලනයට තාවකාලිකව අරගෙන විධිමත් පරීක්ෂණයක් කිරීම සුදුසු බවත් , පසුගිය කාලයේ සමුපකාරයේ පැවති නිලවරණ වල දී ඔවුන් අතර රණ්ඩු කඩාකප්පල්කාරී තත්වයන් ඇති වූ බවත් , මෙපමණ උත්සාහයෙන් මෙම තනතුරු සඳහා පත්වන්නේ මේ නිසා ද යන්න සැක මතු වන බවත් , මේවට නිශ්ශබ්දව සිටි නිසා අද රටටම මෙවන් තත්වයක් උදා වී ඇති බවත් , හොරකම වංචාව දූෂණය නිසා රට මේ තත්වයට පත් වී ඇති බවත් , මීට එරෙහිව ඉදිරිපත් වී වංචාව හොරකම සමාජයෙන් තුරන් කිරීමට කටයුතු කළ යුතු බවත් ගරු විපක්ෂනායක ඒ.ඩබ්.සෝමරත්න මැතිතුමා පවසන ලදී.

තව ද පසුගිය කාලයේ ගංවතුර නායයෑම් වලින් විශාල පිරිසක් විපතට පත් වූ බවත් , ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බවත් , එහි දී ඉන්ධන ගැටළුව නිසා යාමට නොහැකි වූ බවත් , 2017 මැයි 20 නායයෑමට ලක් වූ දෙසීය ගණනකට නිවාස ආධාරවත් ලැබී නොමැති බවත් , නායයෑම් වලින් අධි අවධානමට ලක් වූ ස්ථාන වල ඔවුන් ජීවත් වන බවත් , ඔවුන් සුරක්ෂිත ස්ථාන කරා රැගෙන යා යුතු බවත් පැවසූ ගරු විපක්ෂනායකතුමා මැයි 09 වන දින රට තුළ සිදු වූ නිවාස ගිනිතැබීම් සම්බන්ධව කණගාටුවට පත්වන බවත් , එම පුද්ගලයින්ගේ නිවාස සෑදීමට ප්‍රමුඛතාවට දෙන බවට අදහස් ඉදිරිපත් වී ඇති බවත් , මෙහි දී නායයෑම් අවධානමට ලක් වූ අයට ද ප්‍රමුඛතාවය ලබා දී නිවාස සාදා දෙන ලෙස යෝජනා කළ යුතු බවත් පවසන ලදී.

මෙපමණ රට තුළ අර්බුදයන් පවතින විටත් සීනි සොරකම් සිදු වී ඇති බවත් , ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් ඇති ආයතන වල මේ ආකාරයට විශාල වංචා සිදු කිරීමෙන් ජනතාව අසරණ තත්වයට පත් වන බවත් , සතොසෙන් ද ආහාර ද්‍රව්‍ය යම් සීමාවක් සහිතව ජනතාවට ලබා දෙන බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.සුසන්ත ප්‍රේමකුමාර මැතිතුමා පවසා සිටින ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්.මංජුල දසනායක මැතිතුමා පවසා සිටියේ මැයි 9 වන දින කොළඹ නොයාම සම්බන්ධව ස්තුතිවන්ත වන බවත් , 9 වෙනිදා සිද්ධියේදී තමන් ද අරගල කරුවො ලෙස සටන් පාට කියමින් කටයුතු කළ බවත් , නමුත් කිසිවෙකුට කරදරයක් හිරිහැරයක් නොකළ බවත් , ආහාරපාන ඉන්ධන ආදිය නොමැති වන විට මිනිස්සු අරගල කරන බවත් , අතීතයේ සිට මෙවැනි ගැටුම් දැකිය හැකි වූ බවත් , මෙම ක්‍රමවේදය වෙනස් කළ යුතු බවත් , මේ සිද්ධාන්තය හැකි පමණ පැල්මඩුල්ලෙහි අඩු කිරීමට උත්සාහ කළ බවත් , ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිතුමිය ද කොළඹ පැවති මෙම රැස්වීම සඳහා ගොස් තිබූ නමුත් පැල්මඩුල්ලෙහි ගැටුම් ඇති වීමට ඉඩ නොතිබූ බවත් , මිනිස්සු ඒ දේවල් වලට යොමු වීමේ දී වැළැක්වූ බවත් , අනාගතයේ දී මේ කමවේදය වෙනස් කිරීමට සහයෝගය ලබා දිය යුත බවත් ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ජී.අනෝමා ප්‍රියදර්ශනී ගාල්ලගේ මැතිතුමිය අදහස් දක්වමින් පවසා සිටියේ ගරු චන්ද්‍රා ගන්කන්ද මැතිතුමාට තිබූ නිහතමානීකම නිසා එතුමාගේ දේශපාලනය ඉතා උසස් අයුරින් වර්ණනා කරන බවත් , එතුමාගේ මෙන් ම ගරු වන්නිආරච්චි මැතිතුමාගේ දේශපාලනයේ දීත් ගැටුම් ඇති නොවුන බවත් , සහයෝගයෙන් කටයුතු කළ බවත් , මැයි 09 වන දින රට තුළ විවිධ ප්‍රදේශ වල විශාල ගැටුම් ඇති වූ නමුත් රත්නපුර දිස්ත්‍රික්කයේ ජනයා විවිධ දේශපාලන පක්ෂ වල සිටිය ද අතීතයේ දේශපාලනඥයින් ගිය මාර්ගයේ ගමන් කරන බව එම සිද්ධිය බැලූ විට පැහැදිලි වන බවත් , සියලු දෙනාටම තමන් කැමැති දේශපාලනයක් කිරීමට අයිතියක් ඇති බවත් , අහිංසක මිනිසුන්ට දැනෙන ප්‍රශ්න නිසා අරගල කරන බවත් , තමන් ද සටන් පාට කියමින් අරගලයට සම්බන්ධ වූ නමුත් කිසිවෙකුට හිරිහැරයක් කරදරයක් නොවීමට වග බලා ගත් බවත් , ගරු වන්නිආරච්චි මැතිතුමා දේශපාලනයෙන් නොව තමන්ගේ ආදායමෙන් ගොඩනගා ගෙන ඇති දේවල් බවත් , නමුත් පිටින් පැමිණි පිරිස් එම නිවාස වලට ප්‍රහාර එල්ල කිරීමට සූදානම් වෙද්දී ඒවා වැළැක්වූ බවත් , මේ අවස්ථාවේ දී ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු ලෙස හොඳ දේශපාලන ගමනක යන නිසා විවේචන ඉදිරිපත් කර ගැටුම් ඇති කර ගත යුතු නැති බවත් , සෑම දේපල හානියක් සිදු කිරීම සම්බන්ධව තමා විරුද්ධ වන බවත් ය.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ පැල්මඩුල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ සිදු වූ මෙම සීනි වංචාව නීතිය ඉදිරියට ගෙන ඒම සම්බන්ධව සමූපකාරයේ ගරු උප සභාපතිතමා ඇතුළු කණ්ඩායමට ස්තුතිවන්ත වන බවත් , උප සභාපතිතුමා විසින් පොලීසියට හා සමූපකාර දෙපාර්තමේන්තුවට මේ සම්බන්ධව පැමිණිලි කර ඇති බවත් , ඉතිහාසයේ සිට ම සමූපකාර වල පාරිභෝගික අංශය ඇති බොහෝ අවස්ථාවන්හි මෙවැනි දූෂණ වංචා සිදු වී ඇති බවත් , නමුත් පැල්මඩුල්ල සමූපකාරයෙහි ග්‍රාමීය බැංකු පැවතිය ද පාරිභෝගික අංශයක් නොතිබූ බවත් , කොරෝනා වසංගතයත් සමඟ ජනතාවගේ අවශ්‍යතාවය වෙනුවෙන් පැල්මඩුල්ල විවිධ සේවා සමූපකාර සමිතියේ පාරිභෝගික අංශය ආරම්භ කළ බවත් , සමූපකාරය හරහා මේ වෙන විට ව්‍යාපාරික ස්ථාන 3ක් පවත්වා ගෙන යන බවත් , මේ සීනි වංචාව සිදු කළ කිසිම පුද්ගලයෙක් සම්බන්ධව තමන්ට කිසිම පුද්ගලික තරහක් නොමැති බවත් , කිසිවෙක් අපහසුතාවයට පත්වූවා නම් කණගාටු වන බවත් , මේ වංචාව නීතිය ඉදිරියට නොගියා නම් දිගින් දිගටම මෙවැනි සිද්ධි සිදු වන බවත් , මෙම සොරකම නතර කිරීමට කටයුතු කළේ සමූපකාරයේ අධ්‍යක්ෂක මණ්ඩලය නිසා කොමසාරිස්තුමාගේ දෙපාර්තමේන්තු පාලනයකට යාමට අවශ්‍ය නොවන බවත් , මීට සම්බන්ධ වී ඇත්තේ සමූකාර දෙපාර්තමේන්තුවට රජයේ සේවය කරන රාජ්‍ය සේවකයෝ බවත් , මිනිස්සු පරිභෝජනය කරන සෑම දෙයකටම වගකීමක් ඇති බවත් , භාණ්ඩයේ ඇති සීරියල් අංකය සමඟ එය නිකුත් කළ අය දැන ගත හැකි බවත් , පැලවත්ත සීනි සමාගමෙන් සීනි කිලෝ 5000ක් ජනයාට සීනි කිලෝ 2 ගානේ සහන මිලට දීමට පැල්මඩුල්ල විවිධ සේවා සමූකාරයට නිදහස් කර ඇති බවට ලිපියක් නිකුත් කර ඇති බවත් , සීරියල් අංක පරීක්ෂා කරන විට එයින් කිලෝ 1000ක් එක්තරා ව්‍යාපාරික ආයතනයක තිබූ බවත් , අධ්‍යක්ෂ මණ්ඩලය අවධානයෙන් සිටි නිසා මෙය නීතිය ඉදිරියට ගෙන යාමට හැකි වූ බවත් , එවිට මෙම සිද්ධියෙහි සුල මුල ඉදිරියට පැමිණි බවත් , දැන් කිසිවෙකුට මඟහැර යා නොහැකි බවත් , සියලු දෙනාටම නීතිය එක හා සමාන බවත් , වැරදිකරුවන්ට ඉදිරියට විශාල වශයෙන් දඩුවම් , වන්දි , අලාභ හානි ගෙවීමට සිදු වන බවත් ය.

වාණිජ කළමනාකරු , සාමාන්‍ය අධිකාරීතුමා හා සභාපතිතුමා සම්බන්ධයි ද යන්නත් , ඔවුන් ඉවත් කරනවාද යන්නත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එස්.දයාල් චමින්ද කුමාර මැතිතුමා විමසා සිටින ලදී.

ඊට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙහි දී මෙම සිද්ධියට සමූපකාරයේ සභාපතිතුමා සම්බන්ධයි කියා ඔප්පු කිරීමට තැනක් නොමැති බවත් , ගරු සභාපතිගෙන් හා උපසභාපතිගෙන් කටඋත්තර ගන්නා බවත් , වානිජ කළමනාකරු හා සාමාන්‍ය අධිකාරීතුමා මේ වෙනවිට අත්අඩංගුවෙහි ඇති බවත් , ඔවුන් සත්‍ය ප්‍රකාශ කළ යුතු බවත් , ඒ අනුව මීට සම්බන්ධ කවුරුද යන්න සොයා ගත හැකි බවත් , මේ සම්බන්ධව කූට ලේඛණ සාදා පොත් වෙනස් කර ඇති බවත් , පරීක්ෂණ වලින් ඒවා ඔප්පු වන බවත් , දැන් මෙම සොරකම ඔප්පු වී ඇති බවත් , පැලවත්ත සීනි සමාගම පැල්මඩුල්ල සමූපකාරයට ලබා දුන් සීනි වෙනත් ව්‍යාපාරික ස්ථානයක ඇති බවට සීරියල් අංක වලින් තහවුරු වී ඇති බවත් ය.තව ද ගංවතුරෙන් ජනයා අවතැන් වුවහොත් ජනතාවට සහන සලසන්න ලේකම්තුමා සමඟ පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව ලෙස සූදානම් වී සිටින බවත් ගරු සභාපතිතුමා පවසන ලදී.

- **පසුගිය සභාවේ ලබාගත් තීරණ සම්බන්ධයෙන් ප්‍රගතිය සාකච්ඡා කිරීම.**
- **නිවාඩු අනුමත කිරීම.**

අසනීප තත්ත්වය හේතුවෙන් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇති ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.බිමල්ක ප්‍රමෝදා මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ටී.රිද්මා අනුරුද්ධිකා ධර්මවර්ධන මැතිතුමිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ආර්.පුෂ්පා ප්‍රියදර්ශනී ගුණසේකර මැතිතුමිය හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී කේ.ටී.මෝහන්දාස් මැතිතුමියහට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.හිරන්ති චතුරංගනී ගමගේ මැතිතුමිය විසින් ගෙන එන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ.ඉන්දික මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **මීළඟ සභාව පැවැත්වෙන දිනය තීරණය කිරීම.**

මහා සභාව 2022 ජූනි 09 වන දින පැවැත්වීමට තීරණය විය.

- **සභාපතිතුමාගේ ස්තුති කථාව.**

අද දින සභාවට පැමිණ සිටින ගරු උප සභාපති තුමන්, විපක්ෂ නායක තුමන් ඇතුළු පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රී තුමන්ලාට හා මන්ත්‍රී තුමියන්ලාටත් , ජනමාධ්‍යවේදී මහතුන්ට ද , ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තුතිය පුද කරමින් ගරු සභාපතිතුමා ස්තුති කථාව අවසන් කරන ලදී.

පෙ.ව. 11.25 ට පමණ සභාවේ කටයුතු අවසන් විය.

වාර්තා ගත කළේ

2022-05-31 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ දීය.

ලේකම්
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා ................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා ................................................................... මැතිතුමා/මැතිතුමිය ගේ ස්ථිරත්වයෙන් සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

2022-06-09 වන දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේදී ය.

සභාපති
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව